**විෂය** - නාට්‍ය හා රංග කලාව

**ශ්‍රේණිය** - 8

**කාලච්ඡේද** - 60

| | නිපුණතාවය | ක්‍රියාකාරකම | අත්‍යවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | **Competency** | **Activity** | **Essencial Learning Outcomes** | **Subject content** | **Periods** |
| 7 **ශ්‍රේණියෙන් කාලච්ඡේද** 24 | 01 - නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.4 - විද්‍යුත් මාධ්‍යයෙන් දකින වේදිකා නාට්‍ය | ▪ විද්‍යුත් මාධ්‍ය මගින් නිරූපිත නාට්‍ය (වර්ග) ප්‍රභේද නම් කරයි.<br>▪ වේදිකා නාට්‍යයක් හා රූපවාහිනී නාට්‍යයක් අතර ඇති වෙනස්කම් නම් කරයි. | ▪ විද්‍යුත් මාධ්‍ය මගින් නිරූපිත නාට්‍ය වර්ග<br>▪ වේදිකා නාට්‍ය හා රූපවාහිනී නාට්‍ය අතර ඇති මූලික වෙනස්කම් | 01 |
| | | 1.6 - මිනිස් හා සත්ව චර්යා අනුකරණය කිරීම. | ▪ මිනිස් හැසිරීම නිරීක්ෂණය කරයි.<br>▪ සත්ව චර්යා කෙරෙහි විමසිලිමත් වෙයි.<br>▪ වයස හා අවස්ථා අනුව චර්යා විධි වෙනස් වන බව ප්‍රකාශ කරයි. | ▪ විවිධ මිනිස් හැසිරීම්. සත්ව චර්යා පිළිබඳව නිරීක්ෂණය<br>▪ වයස හා අවස්ථා අනුව චර්යා අනුකරණය | 01 |
| | | 1.7 - පරිසරයෙන් අසන දකින දෑ වේදිකාවට | ▪ ස්වභාවික පරිසරයෙන් ඇසෙන සහ දකින විවිධ දේ නිරීක්ෂණය කරයි.<br>▪ වේදිකා නාට්‍යයකට ශබ්ද යොදා ගැනීමේදී විවිධ උපක්‍රම භාවිත කරයි. | ▪ ස්වභාවික පරිසරයේ ඇසෙන සහ පෙනෙන දෑ අධ්‍යයනය<br>▪ ඒවා නාට්‍ය සඳහා යොදා ගැනීම. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 1.7.2 - ආනුෂංගික කලා හඳුනා ගැනීම. | ▪ ආනුෂංගික කලා යනු මොනවාදැයි පැහැදිලි කර ගනියි.<br>▪ වේදිකා නාට්‍යයක ඇති ආනුෂංගික කලා පිළිබඳ නිරීක්ෂණය කරයි. | ▪ වේදිකා නාට්‍යයක් සඳහා භාවිතා කරන විවිධ ආනුෂංගික කලා<br>▪ ආනුෂංගික අංග මගින් නාට්‍යයකට ඇති ප්‍රයෝජන | 01 |
| | 02 - ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයේ යෙදෙයි. | 2.4 - ඇසූ සැණින් රගමු. | ▪ ක්ෂණිකව අවබෝධ කරගැනීමේ ශක්තිය ලබා ගනියි.<br>▪ ක්ෂණික නිරූපණයේ යෙදෙයි. | ▪ ක්ෂණික නිරූපණය අර්ථකථනය<br>▪ විවිධ වූ මාතෘකා යටතේ සිදු කරන ක්ෂණික නිරූපණ | 01 |
| | | 2.5 - පරිකල්පන අභ්‍යාසයන්හි යෙදීම. | ▪ පරිකල්පනය යනු කුමක්දැයි ප්‍රකාශ කරයි.<br>▪ පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි. | ▪ පරිකල්පනය අර්ථ කථනය<br>▪ විවිධ වූ පරිකල්පනාත්මක ක්‍රියාකාරකම් | 01 |
| | | 2.6.1 - කතා ගොතමු - ගොතා කියමු | ▪ අවස්ථානුකූලව උචිත පරිදි කතාවක් ඉදිරිපත් කරයි.<br>▪ නිර්මාණාත්මකව කතාව ගොතයි.<br>▪ . සාර්ථක කතන්දරයක මූලික ලක්ෂණ දක්වයි. | ▪ සාමූහික කතන්දර නිර්මාණය.<br>▪ කතන්දරයක සාර්ථකත්වයට හේතුවන මූලික ලක්ෂණ | 01 |
| | | 2.7.1 - අපි අප ගැන සොයමු | ▪ ඓතිහාසික කතා වලට පදනම් වූ ජනකතා සොයයි.<br>▪ එම කතා පුවත් ආශ්‍රය කරගෙන නාට්‍ය පෙළක් රචනා කරයි. | ▪ ඓතිහාසික කතා පුවත් හඳුනාගැනීම.<br>▪ ඒවා ආශ්‍රයෙන් පරිකල්පනය මෙහෙයවා නාට්‍ය පිටපතක් රචනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2.9 - වෙස් මුහුණු සහ මකුට සාදා පැළඳ රගම අපි | ▪ ඉවත ලන දේ වලින් ප්‍රයෝජන ගැනීමට හැකියාව ලබයි.<br>▪ රංගනයේදී යොදා ගත හැකි වෙස්මුහුණක් මකුටයක් නිර්මාණය කරයි.<br>▪ විවිධ හැඟීම් ප්‍රකාශ වන පරිදි මුහුණු නිර්මාණය කරයි. | ▪ ඉවතලන දේ වලින් රංගනය සඳහා වෙස් මුහුණක් නිර්මාණය සහ මකුට නිර්මාණය<br>▪ මකුට සහ වෙස් මුහුණු භාවිතයෙන් රංගනය | 01 |
| | 03 - නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.3.2 - නාට්‍ය ගීත ගයමින් රංගනය | ▪ නාට්‍ය ගීත ගායනා කරයි.<br>▪ නාට්‍ය ගීත පිළිබඳව දැනුමක් ලබයි.<br>▪ නාට්‍ය ගීත වලට අදාළව රංගනය කරයි. | ▪ නාට්‍ය ගීත ගායනය සහ රංගනය | 02 |
| | | 3.4.1 - විවිධ නාද අනුකරණය කරමු. | ▪ විවිද නාද අනුකරණය කිරීමට පෙළඹෙයි.<br>▪ .විවිධ අවස්ථාවල පරිසරයේ ඇති විවිධ නාද හඳුනා ගනියි.<br>▪ නාට්‍යමය අවස්ථා නිරූපණය සඳහා විවිධ නාද යොදා ගැනීමට පෙළඹෙයි. | ▪ විවිධ නාද ඇසීම සහ එම නාද අනුකරණය<br>▪ නාට්‍යමය අවස්ථා නිරූපණය සඳහා ඒවා යොදා ගත හැකි ආකාරය | 01 |
| | | 3.4.2 - නම්පොත<br><br>ආශ්‍රය කර ගනිමින් හඩ අභ්‍යාසවල යෙදීම. | ▪ විවිධ ග්‍රාම නාමයන් නිවැරදිව උච්චාරණය කරයි.<br>▪ නම්පොත කියවීමේදී එහි ඇති රිද්මයන් භාවිත කරයි. | ▪ නම්පොතෙහි එන විවිධ ග්‍රාම නාමයන් නිවැරදිව උච්චාරණය<br>▪ එහි එන රිද්මයන් හඳුනා ගනිමින් පැහැදිලිව කටහඬ භාවිතය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ එහි වචන විවිධාකාරයට උච්චාරණය කිරීමට පෙළඹෙයි. | | |
| | | 3.5.1 - ශරීරය උණුසුම් කිරීමේ සහ ශිථිලකරණ අභ්‍යාසවල යෙදීම. | ▪ ශරීරය උණුසුම් කර ගැනීම සහ ශිථිලකරණය මගින් ශරීරය සැහැල්ලු කර ගනියි.<br>▪ මෙම රංග අභ්‍යාසයන්හි වැදගත්කම අවබෝධ කර ගනියි. | ▪ ශරීරය උණුසුම් කර ගැනීමේ රංග අභ්‍යාසයන්හි සහ ශිථිලකරණ රංග අභ්‍යාසයන්හි යෙදීම.<br>▪ රංග අභ්‍යාසයන්හි වැදගත්කම අවබෝධ කර ගනිමින් අදහස් දැක්වීම. | 02 |
| | | 3.6 - විවිධ චරිත සහ අවස්ථා අභිරූපණය මගින් ඉදිරිපත් කිරීම. | ▪ විවිධ චරිත සහ ක්‍රියා අභිරූපණය කරයි.<br>▪ . අභිරූපණය සම්බන්ධ ක්‍රමවේදයන් විස්තර කරයි. | ▪ අභිරූපණය අර්ථදැක්වීම.<br>▪ විවිධ අභිරූපණයන් ඉදිරිපත් කිරීම. | 01 |
| | 04 - නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1<br>4.2 - ඉතිහාස කතා නාට්‍යයට | ▪ නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගත හැකි ඉතිහාස කතා රැස් කරයි.<br>▪ විවිධ ඉතිහාස කතා යොදාගෙන නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.<br>▪ ඉතිහාස කතා වර්තමාන සමාජ ගැටලු සාකච්ඡා කිරීමට යොදා ගනියි. | ▪ විවිධ ඓතිහාසික කතා වර්ග<br>▪ ඒවා තුළ ඇති නාට්‍යමය ගුණය<br>▪ ඒ ඇසුරින් නාට්‍ය රචනය | 02 |
| | | 4.3 - රටට හිතැති චරිත හොයමු. | ▪ ඓතිහාසික කතා පුවත් හා බැඳුණු වීර චරිත නම් කරයි. | ▪ ඓතිහාසික කතා හා බැඳුණු චරිත ,සිද්ධි<br>▪ ඒවා නාටයානුසාරයෙන් නිරූපණය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ▪ එම චරිත ,සිද්ධි හා අවස්ථා නිරූපණය කරයි. | ▪ එම චරිතවල ඇති යහපත් ගුණාංග | |
| | 4.4 - සිරිත් රකිමු<br>- රුගුම් රගමු | ▪ දේශීය සංස්කෘතිය විසින් අගය කරනු ලබන යහපත් සිරිත් අධ්‍යයනය කරයි.<br>▪ . හොද සිරිත් ප්‍රකට කරවන නාට්‍යෝචිත අවස්ථා සිරිත් මල්දම ඇසුරෙන් සොයයි.<br>▪ . යහපත් සිරිත් අගය කරයි. | ▪ සිරිත් මල්දම කෘතිය හදුනා ගනිමින් එහි කවි ගායනා කිරීම.<br>▪ එයින් ප්‍රකාශිත සාරධර්ම<br>▪ එම පද්‍යවල ඇති නාට්‍යමය අවස්ථා | 01 |
| | 5 - නාටයමය අවස්ථා සෞන්දර්යාත්මකව විද ගැනීම සහ මානව හිතවාදීයකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1<br>5.2 - - තේමාව ,කතා වස්තුව,චරිත පිළිබද විමසීම | ▪ නාට්‍ය පෙළින් මතුවන තේමාව ප්‍රකාශ කරයි.<br>▪ .පෙළෙහි නාට්‍යමය ගුණය මතුකර දක්වයි.<br>▪ චරිතවල ගතිස්වභාවයන් විස්තර කරයි. | ▪ පාලිත ලොකුපෝතාගමගේ අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍ය පිටපත රසවින්දනය | 04 |

| | නිපුණතාවය | ක්‍රියාකාරකම | අත්‍යවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | **Competency** | **Activity** | **Essencial Learning Outcomes** | **Suject Content** | **Periods** |
| **8 ශ්‍රේණියෙන් කාලච්ඡේද 36** | 01 - නාට්‍ය හා රංග කලාවට පදනම් වූ සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1<br>2.2.1<br>2.3.1<br>2.6. 3<br>නාට්‍ය පෙළ රචනය හා සංවාද භාවිතය | ▪ නාට්‍ය පෙළක මූලිකාංග පෙළ ගස්වයි.<br>▪ කතාවක් හා නාට්‍යයක් අතර වෙනස සාකච්ඡා කරයි.<br>▪ ලියන ලද නාට්‍ය පෙළෙහි සංවර්ධනය විය යුතු තැන් පිරික්සා බලයි.<br>▪ සංවාද උච්චාරණය කිරීම නිවැරදිව සිදු කළ යුතු අයුරු හඳුනා ගනියි. | ▪ නාට්‍ය පෙළක ඇති මූලිකාංග<br>▪ නාට්‍යයක් සහ කතාවක් අතර ඇති වෙනස්කම්<br>▪ ,නාට්‍ය පෙළක සංවර්ධනය විය යුතු අංග<br>▪ සංවාද උච්චාරණය කිරීම නිවැරදිව සිදු කරන අයුරු | 05 |
| | | 1.2.1<br>2.6.2 -<br>නාට්‍යෝචිත වස්තු රුැස් කිරීම | ▪ නාට්‍යෝචිත බව යනු කුමක්දැයි විමසයි.<br>▪ ජනකතා,ඓතිහාසික කතා හා ජාතක කතා අතරින් නාට්‍යෝචිත සිද්ධි රුැස් කරයි.<br>▪ නාට්‍ය වස්තුවක තිබිය යුතු මූලික ලක්ෂණ හඳුනා ගනියි.<br>▪ නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණ පෙන්වයි. | ▪ නාට්‍යයකට සුදුසු කතාව පැරණි කතාවලින් තෝරා ගන්නා ආකාරය<br>▪ එසේ තෝරා ගන්නා කතාවක හෝ අවස්ථාවක තිබිය යුතු මූලික ලක්ෂණ<br>▪ නාට්‍යෝචිත ලක්ෂණ පිටපතකට ඇතුලත් කිරීම | 02 |
| | | 1.4.1 - සතර අභිනය භාවිතය | ▪ සතර අභිනය නිර්වචනය කරයි.<br>▪ වාචික , ආංගික,සහ සාත්වික අභිනයට අදාළ විශේෂතා පැහැදිලි කරයි. | ▪ සතර අභිනය නිර්වචනය<br>▪ සතර අභිනයට අදාළ මූලික ලක්ෂණ<br>▪ ආනුෂංගික අංග භාවිතය නාට්‍යයකට අදාළව සිදුවන අයුරු | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ ආනුෂංගික අංග භාවිතය අධ්‍යයනය කරයි. | | |
| | 02 - ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයේ යෙදෙයි. | 2.1.1 - තේමාවක් මත ගොතමු කතාවක් | ▪ සිද්ධි පෙළ ගැස්වීමෙන් ගොඩනැගෙන කතාවක් යම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය වන ආකාරය අත්දැකීමෙන් අවබෝධ කර ගනියි.<br><br>▪ විවිධ කතාවලින් විවිධ තේමාවන් ඉස්මතු වන බව පෙන්වා දෙයි.<br><br>▪ සාමූහික කතා නිර්මාණයට පෙළඹෙයි. | ▪ විවිධ තේමා සහිත කතා පුවත් පරිශීලනය<br><br>▪ විවිධ තේමා යටතේ විවිධ කතා වස්තූන් නිර්මාණය | 02 |
| | | 2.4 .1<br>2.4.2 - චරිතයට ඔබිනා නලුවන් තෝරමු. | ▪ නාට්‍ය පෙළට අදාළ චරිත තෝරා ගනියි.<br><br>▪ ඒ ඒ චරිත වල ලක්ෂණ පිළිබඳ විමසයි.<br><br>▪ චරිත වල අභ්‍යන්තර සහ බාහිර ලක්ෂණ විමසමින් ගැළපෙන නලුවන් තෝරයි.<br><br>▪ නාට්‍ය පෙළෙහි චරිත නිරූපණයට අදාළ රූපණය පිළිබඳ පුහුණුව ලබයි. | ▪ නාට්‍ය පෙළෙහි චරිතවලට ගැළපෙන අයුරින් වඩාත් ගැළපෙන නලු නිළියන් තෝරා ගැනීම.<br><br>▪ එම නලු නිළියන් චරිත සතර අභිනයෙන් රූපණය කිරීම සම්බන්ධ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම. | 01 |
| | | 2.5.1 - තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවමු.( සාමූහික සහ කේවල) | ▪ පරිකල්පනය යනු කුමක්ද යන්න අර්ථ කථනය කර ගනියි.<br><br>▪ යම් තේමාවක් ඔස්සේ පරිකල්පනය මෙහෙයවීමට උත්සාහ දරයි. | ▪ පරිකල්පනය පිළිබඳව කේවල සහ සාමූහික වශයෙන් ක්‍රියාකාරකම් | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ පරිකල්පනය මගින් නිර්මාණාත්මක චින්තනය වර්ධනය කර ගනියි. | | |
| | | 2.7.1 -රචනා කර නාට්‍යයට උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය<br>2.7.2 - තෝරාගත් නාට්‍යයට උචිත නාට්‍යෝපකරණ නිර්මාණය<br><br>2.8.1 - නාට්‍යයට අදාළව අංගරචනය කරමු.<br>2.9.1 - නාට්‍යයට අදාළව වේදිකා පසුතල සැලසුම් කිරීම සහ නිර්මාණය<br>2.10.1 - නාට්‍යයට උචිත සංගීතය නිර්මාණය<br>2.11.1 - ආනුෂාංගික කලා භාවිත කරමින් පෙළ රංගයක් බවට පත් කිරීම.<br><br>ආනුෂංගික අංග රංගය සඳහා භාවිත කිරීම. | ▪ වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය,පසුතල, සංගීතය යන ආනුෂංගික අංග හඳනා ගනියි.<br><br>▪ එම ආනුෂංගික අංග නාට්‍ය රංගයට උචිත පරිදි නිර්මාණය කර යොදා ගනියි.<br><br>▪ එම ආනුෂංගික අංග යොදාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කරයි. | ▪ වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංගරචනය,පසුතල, සංගීතය යන ආනුෂංගික අංග පිළිබඳව අධ්‍යයනය<br><br>▪ ඒවා සිසුන් විසින් රංගයට උචිත ලෙස නිර්මාණය<br><br>▪ ආනුෂංගික අංග යොදා ගැනීමේදි සැලකිලිමත් විය යුතු කරුණු | 08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 03 - නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.<br><br>( සහ)<br><br>05 - නාටයමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම සහ මානව හිතවාදීයකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 3.1.1 - නාට්‍යපෙළ අධ්‍යයනය<br><br>1.2.2 - නාට්‍ය පෙළෙහි තේමාව,සංවාද,චරිත හඳුනා ගැනීම.<br><br>3.1.2 - සිද්ධි පෙළ ගස්වා ඇති ආකාරය විමසීම.<br><br>5.1.1<br>5.1.2<br>5.1.3<br>මාෂා සහ වලහා නාට්‍යයේ තේමාව ,චරිත රසවිඳීම. | ▪ නාට්‍යයෙහි කතා පුවත වටහා ගනියි.<br><br>▪ තේමාව ,සංවාද සහ චරිතවල ස්වභාවය අධ්‍යයනය කරයි.<br><br>▪ පෙළෙහි ඇති විවිධ සිදුවීම් විස්තර කරයි. | ▪ නාට්‍ය පෙළෙහි එන කතා පුවත,තේමාව,සංවාද,චරිත නිරූපණය සහ සිද්ධි පෙළ ගැස් වී ඇති ආකාරය අධ්‍යයනය<br><br>▪ මාෂා සහ වලහා නාට්‍යය රසවින්දනය | 07 |
| | 03 - නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.3.1 - බුද්ධ ගද්‍යය කියවමු. | ▪ බුද්ධ ගද්‍යය අදාළ විරිතට අනුව ගයයි.<br><br>▪ බුද්ධ ගද්‍යයේ ඇති වචන නිවැරදිව උච්චාරණය කරයි. | ▪ බුද්ධ ගද්‍යය ගුරු මගපෙන්වීම අනුව තනිවම හඬනගා කියවීම.<br><br>▪ කටහඬ අභ්‍යාස | 01 |
| | | 3.3.2 - ජන ගී ගායනා කිරීම.( දැල් ගී, වැදි ගී, යාතුකර්ම ගී ) | ▪ විවිධ ජන ගී හඳුනා ගනියි.<br><br>▪ ඒ ඒ ගායනය සඳහා භාවිත කරනු ලබන ආවේණික තාල අනුව ගයයි.<br><br>▪ සංවාද භාවිතයේදී හඬ නිවැරදිව යොදා ගනියි. | ▪ දැල් ගී,වැදි ගී,යාතුකර්ම ගී ඒ ඒ තාල අනුව ගායනය<br><br>▪ විවිධ ස්වර විවිධ හැගීම් ,ශබ්ද උද්දීපනය වන ආකාරයට ශ්වසන ක්‍රියාවලියද යොදා ගනිමින් අභ්‍යාසකරණය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 3.4.1 හඩ භාවිත කරමින් තෝරාගත් නාට්‍ය පෙළට අනුව සංවාද භාවිත කරයි. | ▪ හැගීම් ප්‍රකාශ වන පරිදි සංවාද උච්චාරණය කරන විට ගැළපෙන ශාරීරික ක්‍රියාව හඳුනා ගනියි.<br>▪ විවිධ හඩ අභ්‍යාසවල යෙදීම තුළින් චරිත නිරූපණ හැකියාව ලබයි. | ▪ විවිධ වචන විවිධ අර්ථ,හැගීම්,අවස්ථා ප්‍රකාශ වන සේ උච්චාරණය | 01 |
| | | 3.6.1 - රංග ක්‍රීඩාවල යෙදෙමු | ▪ රංග ක්‍රීඩාවේ යෙදෙයි.<br>▪ අවධානයෙන් යුතුව කටයුතු කරයි.<br>▪ ක්ෂනිකව යමක් අවධාරණය කර ගනියි. | ▪ යමක් ක්ෂණිකව මතක තබා ගැනීමට අදාළ වචන මාලාවක් සහිත කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් සිදු කරන රංග ක්‍රීඩා | 01 |
| | 04 - නාට්‍ය හා රංග කලාවට හා සම්බන්ධ ශ්‍රී ලාංකීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1.1<br>4.2.1 - ආගමික කතාවල නාට්‍යමය අවස්ථා සොයමු.<br>4.3.1 - ආගමික රංගයෙන් සරු දහම් ගොඩ නගමු. | ▪ ආගමික කතා රැස් කරයි.<br>▪ ආගමික කතා නාට්‍ය සඳහා යොදා ගනියි.<br>▪<br>▪ ආගමික නාට්‍ය මගින් උකහා ගත හැකි සාරධර්ම විනිශ්චය කරයි. | ▪ ආගමික කතා පිළිබඩ අවබෝධය<br>▪ විවිධ ආගමික කතා වර්ග<br>▪ ඒවා නාට්‍යමය ලෙස නිරූපණය<br>▪ ආගමික කතා සහිත නාට්‍යවල ඇති අගයන් පිළිබඳ සාකච්ඡාව | 02 |